# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2491/68 – 2026 ජුනි මස 05 වැනි සිකුරාදා – 2026.06.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39 (අ) (1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

2019 ඔක්තෝබර් මස 04 දින අංක 2143/54 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි (460 වැනි අධිකාරය වූ ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 2019 අංක 202 දරනආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුලත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කෘෂිකර්ම, පශු සම්පත්,ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත 1 උපලේඛණයේ සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම්
සහ වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය: 4-3/11/2018/UDA/146
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය: BU/LN/1/1/39
2026 මැයි මස 13 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
මිහිකත මැදුර, ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

### 1 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, අංක 821 D, ඇගල්ඔය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ඇගල්ඔය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ක 4846 හා 2021.11.03 දිනැති මූලික පිඹුරෙහි සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කොටස් වලට මායිම් :

**01. කැබලි අංක 01 – මිල්ලගහකුඹුර නොහොත් මිලිගහගොඩැල්ල පමුණුගහගොඩැල්ල – ප්‍රමාණය: හෙක්. 0.0122**

උතුරට: මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); නැගෙනහිරට: ආර්.මනෝජ් රසික ප්‍රභාත් හිමිකම් කියන මිලිගහගොඩැල්ල පමුණුගහගොඩැල්ල; දකුණට: කැබලි අංක 3 සහ 2; බටහිරට: මාර්ගය.

**02. කැබලි අංක 02 – මිල්ලගහකුඹුර නොහොත් මිලිගහගොඩැල්ල පමුණුගහගොඩැල්ල – ප්‍රමාණය: හෙක්. 0.0213**

උතුරට: කැබලි අංක 1; නැගෙනහිරට:කැබලි අංක 3; දකුණට: කැබලි අංක 3 සහ මාර්ගය; බටහිරට: මාර්ගය සහ කැබලි අංක 1

**03. කැබලි අංක 03 – මිල්ලගහකුඹුර නොහොත් මිලිගහගොඩැල්ල පමුණුගහගොඩැල්ල – ප්‍රමාණය: හෙක්. 0.0773**

උතුරට: කැබලි අංක 2 සහ 1; නැගෙනහිරට:ආර්.මනෝජ් රසික ප්‍රභාත් හිමිකම් කියන මිලිගහගොඩැල්ල පමුණුගහගොඩැල්ල; දකුණට: ඇගල්ඔය; බටහිරට: මාර්ගය,කැබලි අංක 2 සහ 1.

EOG 06 – 0058


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.